ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026-09-21

එම්.ජේ. චමිලා කුමාරි මංචනායක ඇතුළු පිරිස
293/ජේ,
බ්‍රැන්ඩියාවත්ත,
වැල්ලම්පිටිය.

පැමිණිලි පාර්ශවය

1. සෙනුර ඉෂාන් කේසර
2. ඩී. ජේ. රවිඳු කනිෂ්ක ඩයස්

වින්දිත පාර්ශවය

1. විදුහල්පති
සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නංගර විදුහල,
කොළඹ 08.

2. විභාග කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත,
බත්තරමුල්ල.

වගඋත්තර පාර්ශවය

පැමිණිලි අංකය - HRC/HO/1740/26

පැමිණිල්ල

පැමිණිලිකාර පාර්ශවය විසින් 2026.05.08 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින්, කොළඹ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර විද්‍යාලයේ වැඩබලන විදුහල්පතිනිය ලෙස කටයුතු කරන ශිරාණි කුසුම් විජේතුංග මහත්මිය විසින්, 2025 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ නාට්‍ය හා රංග කලා විෂය හදාරන සිසුන් කිහිප දෙනෙකුට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට අවශ්‍ය විභාග ප්‍රවේශ පත්‍ර (Admission Cards) නිසි දිනයට ලබා නොදුන් බවට පැමිණිලි කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451
ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අදාළ සිසුන් "කොණ්ඩය කපා නොමැත" යන හේතුව පදනම් කරගනිමින් විදුහල්පතිනිය දිගින් දිගටම ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇති බවත්, මේ හේතුවෙන් 2026.04.29 සහ 30 යන දිනවල කොළඹ ආනන්ද විද්‍යාලයේ පැවති ප්‍රායෝගික පරීක්ෂණවලට පෙනී සිටීමට වින්දිත සිසුන්ට අවස්ථාව අහිමි වී ඇති බව පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

එසේම, වින්දිත සෙනුර ඉෂාන් සිසුවා 2026.04.23 සහ 28 යන දිනවල පාසලට ගිය ද කොණ්ඩය සම්බන්ධ ගැටලුව මත ප්‍රවේශ පත්‍රය ලබා නොදුන් බවත්, පසුව 2026.04.30 දින ප්‍රවේශ පත්‍රය නොමැතිව පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් වූ අවස්ථාවේදී ඔවුන්ට කණ්ඩායම් ඉදිරිපත් කිරීම සඳහා පමණක් අවස්ථාව ලැබුණු බවත් සඳහන් වේ. විදුහල්පතිනිය විසින් 2026.05.02 දිනට දින යොදා පසුව ප්‍රවේශ පත්‍රය ලබා දුන්න ද ඒ වන විට නියමිත පරීක්ෂණ වාරයන් අවසන් වී තිබුණු බව සඳහන් කර ඇත. රවිඳු කනිෂ්ක සිසුවාට ද 2026.04.29 දින එම හේතුව මතම ප්‍රවේශ පත්‍රය ලබා නොදුන් බව සඳහන් කර ඇත.

තව ද, මෙම සිදුවීම පිළිබඳව කරුණු විමසූ සහ සිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි නාට්‍ය හා රංග කලා විෂය භාර සිළුමිණි අලගියවන්න ගුරු මහත්මියට විදුහල්පතිනිය විසින් විවිධ බලපෑම් එල්ල කරන බවට ලංකා ගුරුසංගමය විසින් 2026.06.01 දිනැති ලිපිය මඟින් කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත. එමඟින්, විෂය ඉගැන්වීමට නුසුදුසු ස්ථාන ලබා දීම, පාසල් කළමනාකරණ මණ්ඩලය ඉදිරියේ අපහාසාත්මක ලෙස බැන වැදීම සහ දෝෂාරෝපණය කිරීම මඟින් විදුහල්පතිනිය අත්තනෝමතික ලෙස කටයුතු කරන බවත්,පාසලේ පරිපාලනය බිඳ වැටී ඇති බවත් ලංකා ගුරුසංගමය වැඩිදුරටත් සඳහන් කර ඇත.

එසේම 2026.07.20 දිනැති ලිපිය මඟින්, සමාජ ක්‍රියාකාරී ඓශ්වර්ය ගුණරත්න අධිකාරී මහතා විසින් සෙනුර ඉෂාන් සිසුවා පාසලෙන් ඉවත්ව යන අවස්ථාවේදී 2026.07.09 දිනැතිව විදුහල්පතිනිය විසින් නිකුත් කරන ලද චරිත සහතිකයේ *"විදුහල්පතිනිය හා නිතර ගැටුම් ඇතිකරගනී. කලහකාරී ය. විද්‍යාලීය ඇඳුම නොඇඳීම. විනය විරෝධී ලෙස හැසිරෙන ළමයෙකි"* යනුවෙන් යනුවෙන් ඍණාත්මක සහ ද්වේෂසහගත ප්‍රකාශ සටහන් කර ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇත.

2. වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම

2.1 පළමුවන වගඋත්තරකාරිය - සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර විද්‍යාලයේ විදුහල්පති (රාජකාරි ආවරණ) ශිරාණි කුසුම් විජේතුංග මහත්මිය

ඇය විසින් 2026.06.16 දිනැති විමර්ශනයේදී සහ 2026.06.17 දිනැති ලිඛිත වාර්තාව මඟින් කරුණු ඉදිරිපත් කරමින්, ඇය 2024.07.26 වන දින මෙම පාසලේ රාජකාරි භාරගත් බවත්, පාසල පිහිටා ඇති බොරැල්ල කොට්ඨාසය මත්ද්‍රව්‍ය හා විවිධ අපචාරවලින් ගහන නාගරික පරිසරයක් බැවින් සිසුන්ගේ ආරක්ෂාව හා යහපත උදෙසා පාසලේ විනය නීතිරීති අකුරටම ක්‍රියාත්මක කිරීමට පියවර ගත් බවත් සඳහන් කර ඇත. ඒ අනුව, පාසලට පැමිණීමේදී කොණ්ඩය කොටට කැපීම, කොණ්ඩය පාට නොකිරීම, ඇහිබැම් නොකැපීම සහ රැවුල කැපීම වැනි පොදු විනය පද්ධතියක් සියලුම සිසුන් සඳහා ක්‍රියාත්මක වන බවත්, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටින සිසුන් වුව ද සිය ප්‍රතිඵල ලැබෙන තෙක් පාසලට පැමිණිය යුත්තේ එම විනය මාලාවට අනුකූලව වන බවත්ය.

පැමිණිල්ලේ සඳහන් වින්දිත සිසුන් සම්බන්ධයෙන් කරුණු දක්වමින් විදුහල්පතිනිය, අදාළ සිසුන් විනය නීති උල්ලංඝනය කරමින් කොණ්ඩය පාට කර සහ දික් කර සිටි බැවින් ඔවුන්ට අවස්ථා කිහිපයකදී අවවාද කළ බවත්, එහෙත් නාට්‍ය හා රංග කලාව විෂය භාර ගුරුතුමිය එම සිසුන්ව පාසලේ තාප්පයෙන් පැන පාසලට ගෙන්වා ගෙන සිය පන්ති කාමරයේ සඟවා තබාගෙන සිටි බවට ද, සිසුන් සිය කොණ්ඩය කැපීමට දක්වන ලද අකමැත්ත මත විභාග ප්‍රවේශ පත්‍ර ලබා නොගෙනම ප්‍රායෝගික

පරීක්ෂණයට සම්බන්ධ වී ඇති බවත්, එහිදී ඔවුන්ගේ සාමූහික අංගය සඳහා ලකුණු ලබා දී ඇති බවත් සඳහන් කර ඇත.

තව ද, 2026.04.30 වන දින සෙනුර ඉෂාන් සිසුවාගේ මව ප්‍රවේශ පත්‍රය ඉල්ලා සිටි අවස්ථාවේදී, සිසුවාගේ අත්සන සහතික කළ යුතු බැවින් මවට එය ලබා දීම ප්‍රතික්ෂේප කළ බවත්, එම අවස්ථාවේ සිසුවා පාසල් ගේට්ටුව අසල රැඳෙමින් මුරකරු සමඟ බහින්බස් වී තමාට පරුෂ වචනයෙන් බැන වැදුණු බවත් සඳහන් කර ඇත. පසුව බොරැල්ල පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිතුමියගේ මැදිහත්වීම මත, සිසුවා කොණ්ඩය සහ රැවුල කපා පස්වරු 3.30ට පමණ පාසලට පැමිණි පසු විභාග ප්‍රවේශ පත්‍රය අත්සන් කර ලබා දුන් බවයි. සෙනුර ඉෂාන් සිසුවා 2025 වර්ෂයේ පාසල් දින 173 කින් දින 53 ක් පමණක් පැමිණ තිබියදීත් (පැමිණීම 30% කි), ඔහුට විභාගය සඳහා අයදුම් කිරීමට මානුෂීය පදනමින් අවස්ථාව ලබා දුන් බව ද විදුහල්පතිනිය වැඩිදුරටත් සඳහන් කර ඇත.

විෂය භාර ගුරුතුමිය වන සිළුමිණි අලගියවන්න මහත්මිය පිළිබඳව කරුණු දක්වමින් විදුහල්පතිනිය, ඇය පාසලේ විනය පද්ධතිය කඩාකප්පල් කරමින් සිසුන්ව පාලනාධිකාරියට එරෙහිව මෙහෙයවන බවත්, ටෙලි නාට්‍යවල රඟපෑම සඳහා අධික ලෙස අසනීප නිවාඩු වාර්තා කරමින් සිසුන්ගේ අධ්‍යයන කාලය පැහැර හරින බවත්ය. ඇයගේ මෙම ක්‍රියාකලාපය පිළිබඳව අවවාද කිරීම නිසා ඇය තමා සමඟ අමනාපයෙන් පසුවන බවත්, ගුරු සංගම් නායක ජෝසප් ස්ටාලින් මහතා ලවා තමාට දුරකථනයෙන් බලපෑම් කළ බවත්ය. එසේම පාසලේ විනය පවත්වාගෙන යාමට උත්සාහ කිරීමේදී මෙවැනි චෝදනාවලට ලක්වීමට සිදුවීම සාමාන්‍ය තත්ත්වයක් බවත්, දරුවා කෙරෙහි මානුෂීයව සලකා බලා ඔහුට අගතියක් නොවන පරිදි සාධාරණයක් ඉටු කරන ලෙස තමා ඉල්ලා සිටින බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

2.2 දෙවන වගඋත්තර- විභාග දෙපාර්තමේන්තුව

විභාග දෙපාර්තමේන්තුව නියෝජනය කළ නියෝජ්‍ය විභාග කොමසාරිස් එස්. විශ්වනාදන් මහතා, මෙම සිදුවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විමර්ශනයක් ආරම්භ කර ඇති බව සඳහන් කර ඇත. ඒ අනුව, ප්‍රවේශ පත්‍රය නොමැති වුව ද සිසුන් කණ්ඩායම් ඉදිරිපත් කිරීම සඳහා සහභාගී වී ඇති බැවින්, සාමාන්‍යයෙන් ප්‍රායෝගික පරීක්ෂණයට ඉදිරිපත් නොවන අපේක්ෂකයෙකුට ලබා දෙන "නොපැමිණි" (Absent) සලකුණ වෙනුවට, විමර්ශන තීරණයට යටත්ව ඔවුන්ගේ ලකුණු නිකුත් කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

3. නිරීක්ෂණ

1. වින්දිත සෙනුර ඉෂාන් කේසර සිසුවා 2026.06.16 දින පැවති විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබා දෙමින්, ඔහු 2026.04.23 වන දින ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමට පාසලට ගිය අවස්ථාවේදී *"කොණ්ඩය කපාගෙන එන ලෙස"* දන්වා විදුහල්පතිනිය එය ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත්, නැවත 2026.04.28 වන දින ගිය අවස්ථාවේදී ද එම හේතුව මතම ප්‍රවේශ පත්‍රය ලබා නොදුන් බවත්ය. ඒ හේතුවෙන්, 2026.04.30 වන දින ප්‍රවේශ පත්‍රය නොමැතිවම විභාග මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් වීමට ඔහුට සිදු වූ බවත්, එහිදී ප්‍රවේශ පත්‍රය නොමැති වීම නිසා ඔහුට පෞද්ගලික අංගය ඉදිරිපත් කිරීමට අවස්ථාව අහිමි වී ඇති අතර, පසුව 2026.05.02 දිනට දින යොදා ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීමට විදුහල්පතිනිය කටයුතු කර ඇති බව වැඩිදුරටත් සඳහන් කර එහි ඡායා පිටපත ඉදිරිපත් කර ඇත.

2. වින්දිත රවිඳු කනිෂ්ක ඩයස් සිසුවා 2026.06.16 දින පැවති විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබා දෙමින්, ඔහු 2026.04.29 වන දින පාසලට ගිය ද කොණ්ඩය සම්බන්ධ ගැටලුව මත ප්‍රවේශ පත්‍රය ලබා නොදුන් බවත්, මේ දක්වා විදුහල්පතිනිය තමාට ප්‍රවේශ පත්‍රය ලබා දී නොමැති බවත් සඳහන් කර ඇත.

3. 2026.06.16 දින පැවති විමර්ශනයේ කරුණු දක්වමින් පළමු වගඋත්තර විදුහල්පතිනිය විසින් පාසල අවට පවතින නාගරික පරිසරයේ මත්ද්‍රව්‍ය හා අපචාර බහුල බැවින් විනය පද්ධතිය අකුරටම ක්‍රියාත්මක කිරීමට සිදු වූ බවත්, සිසුන්ගේ කොණ්ඩය, රැවුල සහ ඇඟි බැම් සම්බන්ධයෙන් පනවා ඇති පාසල් රීතීන් වින්දිත සිසුන් උල්ලංඝනය කළ බවත්, එම තත්ත්වයන් නිවැරදි කරගන්නා තෙක් ප්‍රවේශ පත්‍රය ලබා නොදුන් බවත් සඳහන් කර ඇත.

4. රජයේ ජාතික විභාගයක් සඳහා පාසල් අයදුම්කරුවන් ලෙස පෙනී සිටින වින්දිත සිසුන් ද එම විද්‍යාලය විසින් පනවා ඇති පොදු විනය මාලාවට සහ රීතීන්වලට අනුගත වීමට වගකීමක් සහ බැඳීමක් සහිතය. පාසල් පද්ධතියක සමස්ත පැවැත්ම සහ ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම උදෙසා සිසුන් ද නියමිත විනය පටිපාටියට අනුකූලව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම සිදුවීමේදී වින්දිත සිසුන් පාසල් බලධාරීන් විසින් කරන ලද දැනුම්දීම්වලට ගරු කරමින්, විභාගයට පෙර කොණ්ඩය කැපීම වැනි මූලික විනය රීතීන් පිළිපැදීමට කටයුතු කළේ නම්, මෙම පරිපාලනමය ගැටුම මුල් අවස්ථාවේදීම මඟහරවා ගැනීමට හෝ විසඳා ගැනීමට පූර්ණ අවකාශය තිබූ බව ද නිරීක්ෂණය වේ. පාසල් අයදුම්කරුවන් ලෙස පෙනී සිටින සිසුන් විනය පාලනයෙන් බැහැර වූ පිරිසක් ලෙස කටයුතු කිරීම පාසල් පද්ධතියේ විනය පිරිහීමට ද හේතු විය හැකි අතර, අධ්‍යාපන අයිතිය භුක්ති විඳීමේදී තමන් සතු යුතුකම් සහ වගකීම් නිසි පරිදි ඉටු කිරීමට ද සිසුන් සැලකිලිමත් විය යුතු බව නිරීක්ෂණය වේ.

5. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන විභාග ප්‍රවේශ පත්‍රයක් යනු රජයේ ජාතික විභාගයකට පෙනී සිටීම සඳහා ශිෂ්‍යයෙකුට පවතින නෛතික අවසර පත්‍රයයි. කොණ්ඩය කැපීම හෝ රැවුල වැවීම වැනි පාසලක පවතින අභ්‍යන්තර විනය නීති පද්ධතියක් පදනම් කරගනිමින්, රජයේ විභාගයකට අදාළ නිල ලේඛනයක් රඳවා තබා ගැනීමට විදුහල්පතිවරයෙකුට නීත්‍යානුකූල බලයක් නොමැති බව නිරීක්ෂණය වේ. 01 වන වගඋත්තරකාර විදුහල්පතිනිය සිය පරිපාලනමය බලතල අත්තනෝමතික ලෙස භාවිතා කරමින් සිසුවාගේ උපරිම යහපත පිළිබඳව අවධානය යොමු නොකර සිසුන්ගේ ප්‍රවේශ පත්‍ර රඳවා තබා ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

6. වින්දිත සෙනුර ඉෂාන් සිසුවා 2026.04.23 සහ 28 යන දිනවල අවස්ථා කිහිපයකදී ප්‍රවේශ පත්‍රය ඉල්ලා සිටියදීත් එය ලබා නොදීමත්, අවසානයේ විභාගය පැවැත්වෙන දිනයේ (2026.04.30) පස්වරු 3.30 වන තෙක් එය ප්‍රමාද කිරීමත් තුළින් විදුහල්පතිනිය සවිඥානිකව සිසුන්ට අගතියක් සිදු කර ඇති බව පෙනී යයි. ප්‍රවේශ පත්‍රය නොමැති වීම හේතුවෙන් ප්‍රායෝගික පරීක්ෂණයේ 'පෞද්ගලික අංගය' (Individual Component) සඳහා පෙනී සිටීමට තිබූ අවස්ථාව සිසුන්ට අහිමි වී ඇති අතර, මෙය ඔවුන්ගේ සමස්ථ විභාග ප්‍රතිඵලයට සහ අනාගතයට සිදු කළ හානියක් බව නිරීක්ෂණය වේ.

7. සෙනුර ඉෂාන් සිසුවාට 2026.07.09 දින නිකුත් කර ඇති චරිත සහතිකය පිළිබඳව යොමු කිරීමේ දී, එහි *"විදුහල්පතිනිය හා නිතර ගැටුම් ඇති කරගනී, කලහකාරී ය"* වැනි ඍණාත්මක ප්‍රකාශ සටහන් කර තිබීම තුළින් වගඋත්තරකාරිය වින්දිතයා කෙරෙහි ද්වේෂසහගතව කටයුතු කර ඇති බව පැහැදිලි වේ. 2026.07.22 වන දින පැමිණිලිකාරිය දුරකථනය මඟින් සම්බන්ධ කර ගැනීමේ දී මෙම චරිත සහතිකය සම්බන්ධයෙන් සමාජය තුළ හා සමාජ මාධ්‍ය තුළ දැඩි කතාබහට ලක්වීමෙන් පසුව විදුහල්පතිනිය විසින් ඉහත කරුණු ඉවත් කර, චරිතය සහ හැසිරීම "හොඳයි" ලෙස සටහන් කර නව චරිත සහතිකයක් නැවත ලබාදුන් බවට එහි ඡායා පිටපත් සහිතව කොමිෂන් සභාවට දැනුම් දී ඇත.

04. නිගමනය

මෙම පැමිණිල්ලට අදාළව ඉදිරිපත් වූ කරුණු හා සාක්ෂි විශ්ලේෂණය කිරීමේදී, පළමුවන වගඋත්තරකාර විදුහල්පතිනිය විසින් විභාග ප්‍රවේශ පත්‍ර අත්තනෝමතික ලෙස රඳවා තබා ගනිමින් ඒවා නිකුත් කිරීම සිතාමතා ප්‍රමාද කිරීම සහ සිසුන්ගේ අනාගත අභිවෘද්ධියට හානි වන අයුරින් ඍණාත්මක සහිත චරිත සහතික නිකුත් කිරීම තුළින්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1)

ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති 'නීතිය ඉදිරියේ සමානත්වය සහ නීතියේ සමාන රැකවරණය ලැබීමේ' මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරයි.

කෙසේ වුවද, වින්දිත සිසුන් විභාග ප්‍රවේශ පත්‍රය නොමැතිව වුවද කණ්ඩායම් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සහභාගී වී ඇති බැවින් සහ ඒ අනුව ඔවුන්ගේ විභාග ලකුණු නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මේ වන විට අවශ්‍ය පියවර ගෙන ඇති බැවින්, එම දෙපාර්තමේන්තුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුකර නොමැති බව නිගමනය කරනු ලැබේ.

05. නිර්දේශ

1. ජාතික විභාග ප්‍රවේශ පත්‍රයක් රඳවා තබා ගැනීමෙන් සිසුන්ගේ අධ්‍යාපන අයිතිය උල්ලංඝනය කිරීම, සහ සිසුවෙකුගේ අනාගතයට හානි වන අයුරින් අත්තනෝමතික ලෙස චරිත සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් 01 වන වගඋත්තර විදුහල්පතිනියට එරෙහිව බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

2. පාසලක අභ්‍යන්තර විනය ගැටලු පදනම් කරගනිමින් කිසිදු හේතුවක් මත රජයේ විභාග සඳහා වන ප්‍රවේශ පත්‍ර රඳවා තබා ගැනීමට විදුහල්පතිවරුන්ට බලයක් නොමැති බව අවධාරණය කරමින් සියලුම රජයේ පාසල් වෙත චක්‍රලේඛයක් නිකුත් කිරීමට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගත යුතුය.

3. පාසල් චරිත සහතිකයක් යනු ශිෂ්‍යයකුගේ අනාගත අධ්‍යාපනික සහ වෘත්තීය ජීවිතය තීරණය කරනු ලබන තීරණාත්මක නිල ලේඛනයක් බැවින්, එය විදුහල්පතිවරුන්ගේ පෞද්ගලික අමනාපකම් පිරිමසා ගැනීමේ මෙවලමක් ලෙස භාවිතා කිරීම වැළැක්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගත යුතුය. චරිත සහතිකයකට සෘණාත්මක සටහන් ඇතුළත් කරන්නේ නම්, ඒ සඳහා වන නිශ්චිත සාධක සහ විධිමත් විනය පරීක්ෂණ වාර්තා පදනම් කරගත යුතු බවටත්, හුදු පෞද්ගලික අදහස් ඇතුළත් කිරීම වෘත්තීය විෂමාචාරයක් ලෙස සලකන බවටත් අවධාරණය කරමින් සියලුම පාසල් ප්‍රධානීන් දැනුවත් කිරීමට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා කටයුතු කළ යුතුය.

4. පාසල් පාලනාධිකාරිය සහ සිසුන් අතර මෙවැනි පරිපාලනමය ගැටලු පැනනගින අවස්ථාවලදී, පවතින විනය රීතීන්ට අනුකූල වීම තුළින් එම ගැටලු මුල් අවස්ථාවේදීම සමථයකට පත් කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව සිසුන් දැනුවත් කළ යුතුය. සිසුන් සිය වගකීම් මඟහැරීම තුළින් අනවශ්‍ය පරිපාලනමය අර්බුද නිර්මාණය වන බැවින්, අයිතිවාසිකම් භුක්ති විඳීමට සමගාමීව වගකීම් සහ යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පිළිබඳව අවබෝධයක් ලබා දීමට කලාප අධ්‍යාපන කාර්යාලය පියවර ගත යුතුය.

5. පාසල් විනය පද්ධතියක් පවත්වාගෙන යාම සහ සිසුන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම යන කරුණු දෙකම සමබරව පවත්වාගෙන යාම සඳහා, පාසල් අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු අවම විනය ප්‍රමිතීන් පිළිබඳව බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සියලුම සිසුන් සහ දෙමාපියන් වෙත පැහැදිලි මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය.

2026. 11 . 18 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු), සභාපති, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.	නිමල් ජී. පුංචිහේවා, ජ්‍යෙෂ්ඨ නීතිඥ, කොමසාරිස්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික) සභාපති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව	[illegible] නිමල් ජී. පුංචිහේවා ජ්‍යෙෂ්ඨ නීතිඥ කොමසාරිස් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :

1. අමාත්‍යතුමිය - කරුණු දැන ගැනීම සඳහා
   අධ්‍යාපන අමාත්‍යාංශය
   ඉසුරුපාය
   බත්තරමුල්ල

2. ලේකම් - නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා
   බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
   ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
   බත්තරමුල්ල.

3. අධ්‍යක්ෂ - නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා
   කලාප අධ්‍යාපන කාර්යාලය
   කොළඹ.